## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - 2019

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේඅභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාර පිරිවැය රු.13,334,708,033 ක් වූ දේපල පිරියත හා උපකරණ එහි සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. තවද කොමිෂන් සභාවට අයත් රු.45,000,000 ක් වටිනා අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 ඉඩමකින් ආසන්න වශයෙන් සියයට 69 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් අත්කරගෙන තිබුණද ඊට අදාල ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි. | ස්ථාවර වත්කම් සාධාරණ වටිනාකමට ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීමටත් කෙටුම්පත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තිය කොමිෂන් සභාවේ අනුමැතියෙන් පසු ඒ අනුව ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය සිදු කිරීමටත් අපේක්ෂා කරමු.<br>කදිරාන ඉඩමේ සත්‍ය තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් යොදා ඇත. කටාන ප්‍රාදේශීය සභාවෙන් අත්පත් කරගත් ඉඩම් | වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම යටතේ ගිණුම්ගත කිරීමට පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | කොටස මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ගත නොහැකි වූයේ ගිණුම්කරණ ප්‍රමිත අනුව මුළු වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කිරීමට ගිණුම් වර්ෂය අවසන් වන විටත් සිදු නොවී ඇති හෙයිනි. | |
| (ආ) | සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා පිරිවැය රු.12,978,983 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රමිතියේ 51ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයේ අධීක්ෂණය සඳහා ඉදිරිපත් කර ඇති කෙටුම්පත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තිය කොමිෂන් සභාවේ අනුමැතියෙන් පසු ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය සිදුකිරීමට අපේක්ෂා කරමු. | වත්කම් නැවත අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීම කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පරිගණක සහ කාර්යාල උපකරණ ක්ෂය රු.2,182,606 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | මෙය 2020 ගිණුම්වලදී නිවැරදි කිරීමට දැනටමත් කටයුතු කර ඇති බව. | වත්කම් ක්ෂය කිරීම් නිවැරදිව සිදුකර ගැලපීම් සිදුකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල රු.3,129,627 ක වියදම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ලාභය වැඩියෙන් දක්වා තිබුණි. | රු.3,129,627 ක මුදල උපචිත වියදම් ලෙස සටහන් කර නොමැති බවට එකග වෙමු. ඉදිරි මූල්‍ය වර්ෂයේ නියමිත පරිදි උපචිත වියදම් සටහන් තැබීමට කටයුතු කරන බව. | උපචිත වියදම් නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

## 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූලාා ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| (අ) | ආර්ථික සේවා ගාස්තු බද්දට යටත් පිරිවැටුම | 15,431,747,032 | 16,812,468,625 | 1,380,721,593 | 2019 මාර්තු මස පිරිවැටුම ආර්ථික සේවා ගාස්තු ගණනය කිරීමේදී වැරදී අගයක් ඇතුලත් කිරීම නිසා මෙම වෙනස ඇති වී ඇත. 2019 වර්ෂය තුළ ගෙවූ මුළු ආර්ථික සේවා ගාස්තු මුදලම බදු බැරක් ලෙස ආදායම් බදු වගකීම ගණනයේදී අඩුකර ඇති බව. | ගිණුම්වල සඳහන් ශේෂය හා උපලේඛන වල සඳහන් ශේෂය සමඟ එකඟ විය යුතු බව. |
| (ආ) | එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ ශේෂය | 18,649,359 | 63,459,533 | 44,810,174 | එකතුකළ අගය මත බදු නියමාකාරයෙන් 2019 වසර තුළ ගිණුම් ගත කර පසුගිය වර්ෂයන්වල එකතුකළ අගය මත ගිණුම විශ්ලේෂණය කර වෙනස නිරීක්ෂණය කිරීමට කටයුතු කරන බව. | ගිණුම්වල සඳහන් ශේෂය හා උපලේඛන වල සඳහන් ශේෂය සමඟ එකඟ විය යුතු බව. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | භාණ්ඩාගාර තැන්පතු | 354,000,000 | ආයෝජන සහතිකපත | මෙම තැන්පතුව සඳහා මුදල් මහජන බැංකුවේ නාරාහේන්පිට ශාඛාවේ අංක 119100143693169 දරන ගිණුමට චෙක්පත් නිකුත් කර ඇති බවත් 2020 ජූනි 29 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගෙන් මෙම තැන්පතු පිළිබඳ වැඩිදුර තොරතුරු විමසා ඇති බව. | තහවුරු කිරීමට අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ණයගැති ශේෂය | 344,792,045 | ශේෂ තහවුරු කිරීමේ ලිපි | 2019.12.31 දින වනවිට සියළුම රු. මිලියන 1 කට වඩා වැඩි ණයගැතියන් වෙත ශේෂය තහවුරු කිරීමේ ලිපි සෘජුවම ඔබ ආයතනය වෙත ලැබෙන ලෙස දන්වා ලියාපදිංචි තැපෑල මගින් ලිපි යොමු කළ අතර, එම ලිපිවල පිටපත්ද ඔබ ආයතනය වෙත ලැබීමට කටයුතු සැලසූ බව. | ගිණුම්වලට ඇතුළත් ලැබිය යුතු ණය ශේෂය පිළිබඳව ලිඛිත සාක්ෂි මගින් තහවුරු කර ගත යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 අප්‍රේල් සිට 2019 දෙසැම්බර් දක්වා හා 2019 වර්ෂය සඳහා සෙස් බදු අයවිය යුතු ආයතන 02 ක් 2020 | Supreme SAT (Pvt) Ltd ආයතනයේ 2019 වර්ෂය සඳහා සෙස් බදු අයකර ගැනීමට කටයුතු කරමින් සිටී. Lanka Broadband Network Limited | පමාවකින් තොරව සෙස් බදු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අගෝස්තු 18 දින වන විට පැවතිනි. එසේම ලැබිය යුතු ආරම්භක සෙස් බදු ශේෂය වූ රු.1,610,199 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි. | ආයතනය 2016 වර්ෂයේ සිට නොගෙවූ සෙස් බදු අයකර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය ලිපිගොනු ඉදිරිපත් කර ඇත. 2019 ජූනි මස සිට විදුලි සංදේශ බලපත්‍ර ඉකුත් වී ඇති City Cable Links (Pvt) Ltd ආයතනය වෙත බලපත්‍ර නිකුත් කර සෙස් බදු අයකර ගැනීමට කටයුතු කරමි. | |
| (ආ) | ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමෙන් ප්‍රමාද විදුලි සංදේශ සංවර්ධන ගාස්තු සඳහා ගෙවිය යුතු රු.813,505 ක අධිභාර මුදල අයකර ගෙන නොතිබුණි. | මෙම අධිභාර මුදල අවලංගු කිරීමට කොමිෂන් සභාවේ අනුමැතිය 2019 ජනවාරි 16 දින ලබාදී ඇත. ජාත්‍යන්තර විදුලි සංදේශ බදු ගෙවීම් සම්බන්ධ මාර්ගෝපදේශ මාලාව ගැසට් කිරීමට භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබුණු පසු මාර්ගෝපදේශ මාලාව ගැසට් කිරීමෙන් අනතුරුව කොමිෂන් සභා තීරණය පරිදි අධිභාර මුදල අවලංගු කිරීමට කටයුතු කරනු ඇත. | පවත්නා නීතිය යටතේ අධිභාර මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කල්බදු ගිවිසුම්වලට එළඹ නොතිබීම හේතුවෙන් කොකාවිල් ඇන්ටනා හා ට්‍රාන්ස්මිෂන් කුලුන භාවිතා කරන රාජ්‍ය ආයතන 03 න් කල්බදු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ස්වාධීන රූපවාහිනී සේවය යන ආයතන කොකාවිල් සම්ප්‍රේෂණ කුලුන භාවිතයට අදාල ගිවිසුම් පිටපත් එම ආයතන වෙත ඉදිරිපත් කර ඇති අතර අද දක්වා මෙම ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර නොමැත. | සියළුම ක්‍රියාකරුවන් සමඟ කල්බදු ගිවිසුම්වලට එළඹිය යුතුය. ගිවිසුම් අනුව අයවිය යුතු මුදල අයකර ගත යුතුය. |
| (ඈ) | ගිවිසුම් ගත වූ ක්‍රියාකරුවන් දෙදෙනෙකුගෙන් 2019 අගෝස්තු මාසයේ සිට රු.1,323,856 ක කල්බදු ශේෂයක් අයවීමට තිබුණි. | එටිසලාට් සමාගම 2019 වර්ෂය සඳහා වූ කල්බදු වාරික ගෙවීම් අතරින් 2019 අගෝස්තු මාසයේ සිට දෙසැම්බර් දක්වා කාලයට අදාල ගෙවීම් සිදුකරන ලෙසට 2020 මැයි 20 සිහිකැඳවීමක් යවා ඇත. මොබිටෙල් සමාගමට 2019 වර්ෂයේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලයට අදාල වූ ගෙවීම් සිදුකරන ලෙස 2019 නොවැම්බර් 26 දින හා 2020 පෙබරවාරි 17 දින සිහිකැඳවීම් යවා ඇත. | කල්බදු ගිවිසුම්වලට අනුව කල්බදු මුදල් අයකර ගත යුතුය. |
| (ඉ) | කොකාවිල් ඇන්ටනා හා ට්‍රාන්ස්මිෂන් කුලුන භාවිතා කරන ක්‍රියාකරුවන් 05 දෙනෙකුගෙන් විදුලි බිල්පත් වෙනුවෙන් රු.81,813,102 ක් | මොබිටෙල් සමාගමට ඔක්තෝබර් හා දෙසැම්බර් මාසවල නොගෙවූ විදුලි බිල්පත් සඳහා සිහිකැඳවීම් යවා ඇත. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ස්වාධීන | මුදල් අයකර ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දී අයකර ගත යුතු මුදල් කඩිනමින් අයකර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | අයවිය යුතු වූ අතර මෙහි ඇතුළත් ස්වාධීන රූපවාහිනී සංස්ථාවෙන්, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවෙන් 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අයවිය යුතුව පවතින රු.74,627,891 ක මුදල අයකර ගැනීම අවිනිශ්චිතව පැවතුනි. | රූපවාහිනී සේවය යන ආයතනයන්හි හිඟ ගෙවීම් පිළිබඳව ඒකී ආයතන හා ජනමාධ්‍ය අමාත්‍යාංශය පිළිවෙලින් 2020.06.30 හා 2020.07.13 දිනැති ලිපි මඟින් දැනුවත් කර ඇත.<br>මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක සියලු ක්‍රියාකරුවන්ට විදුලි බලය වෙනම ලබා ගන්නා ලෙස දන්වා ඇති අතර එයින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ස්වාධීන රූපවාහිනී සේවය යන ආයතන මෙම කාර්යය සම්පූර්ණ කිරීමට කටයුතු කර නොමැත. | |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට වසර 02 කට වැඩි රු.373,700,914 ක් වූ ණයගැති ශේෂය තුළ වසර 38 ක් පැරණි ණය ශේෂයන්ද ඇතුළත් වී තිබුණි. එසේම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් හා ආයතන 08 කින් අයවිය යුතු ණය ශේෂය පිළිවෙලින් රු.145,254,449 ක් හා රු.197,130,954 ක් විය. තවද පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් අයවිය යුතු රු.8,184,000 ක් සහ කොමිෂන් සභාව ආරම්භ කිරීමට පෙර සිට පවතින ආයතන 04 ක ණය ශේෂය රු.5,613,513 ක් අයකර ගැනීම අවිනිශ්චිතව පැවතුනි. | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් මුදල් අයකර ගැනීම සඳහා දැනටමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර ඇති බව හා කොමිෂන් සභාව ආරම්භ කිරීමට ප්‍රථම අයකරන ලද ගාස්තු පොත්වලින් ඉවත් කිරීමට ඇති හැකියාව පරීක්ෂා කර එම අගයන් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව.<br>නොපියවන ලද මෙම මුදල සම්බන්ධයෙන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඒ සම්බන්ධව කටයුතු කරන බව.<br>Electrotex Ltd ආයතනයට ප්‍රදානය කරන ලද රේඩියෝ සංඛ්‍යාත බලපත්‍රය සම්බන්ධයෙන් දැනට කොළඹ සිවිල් මහාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බව. | අයවිය යුතු ණය ශේෂයන් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී වැඩියෙන් අයකර ගෙන තිබූ රු.2,158,081 ක ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් වැඩිදුරටත් විශ්ලේෂණය කර ඊට අදාළ ගතහැකි ක්‍රියාමාර්ග කොමිෂන් සභාවේ තීරණයට යටත්ව ගැනීමට කටයුතු කරන බව. | වැඩියෙන් අයකර ඇති ණය ශේෂය නිරවුල් කළ යුතුය. |
| (ඌ) | කොමිෂන් සභාව විසින් කුලියට ලබාගත් පෞද්ගලික ගොඩනැගිල්ලක් 2015 වර්ෂයේදී නැවත භාරදී තිබුණද ඒ සඳහා ගෙවූ අත රුඳවුම් මුදල (key money) වූ රු.1,350,000 ක් ආපසු අයකර ගෙන නොතිබුණි. | අදාල ගොඩනැගිල්ල පිළිබඳ මුල් ලිපිගොනුව FCID ආයතනය වෙත ලබා දී ඇති බැවින් එම ලිපි ගොණුවෙහි පිටපතක් ලබා ගැනීමට කටයුතු කරන ලදී.<br>ඒ අනුව එම ලිපි ගොනුව හා අවශ්‍ය ලේඛන නීති අංශය වෙත ඉදිරිපත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපදෙස් ඉල්ලා සිටි අතර නීති අංශය | අයවීමට ඇති අතරුඳවුම් මුදල අයකර ගැනීම විමර්ශන කටයුතු නිමවන තෙක් ප්‍රමාද නොකර අයකර ගැනීම් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | විසින් දැනුම් දී ඇත්තේ මේ සම්බන්ධ අල්ලස් දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව හෝ වෙනත් නෛතික ආයතන මගින් සිදු කරන කටයුතු අවසාන වූ පසුව මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතු බවයි. | |
| (එ) | නිලධාරිණියක් වෙත වැඩ තහනම් කරන ලද කාලය තුළදී දිරි දීමනා ලෙස වැඩිපුර ගෙවන ලද රු.424,000 ක මුදල 2019 අගෝස්තු 29 දිනැති විනය නියෝගයෙහි සඳහන් පරිදි ආපසු අයකර ගැනීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණ අතර සේවයෙන් පහකළ මෙම නිලධාරිනියට පාරිතෝෂික ගෙවීම ප්‍රමාද වීම නිසා රු.166,500 ක අධිභාරයක්ද ගෙවා තිබුණි. | 2019.08.29 දින නිකුත් කරන ලද විනය නියෝගය අනුව ඒ.කේ.ඒ. සිල්වා මහත්මියට වැඩිපුර ගෙවන ලද රු.424,000 ක මුදල ආපසු ගෙවන ලෙස දන්වා තිබුනද ඇය එම ගෙවීම පැහැර හරින ලදී. වැඩිපුර ගෙවීම්, පාරිතෝෂිකය ගණනය කිරීමේදී අඩු කර ගැනීමට පාරිතෝෂික ගෙවීම් පනත අනුව සේවායාහට නීතිමය හැකියාවක් නොමැති බව කම්කරු කොමසාරිස් ජනරාල් දැන්වූ බැවින් එම නියෝග මත පාරිතෝෂිකය ගණනය කිරීම සිදු කර තිබුණි. මේ සඳහා නෛතික උපදෙස් ලබා ගැනීම සඳහා අදාල පාර්ශව වෙතින් විමසීම් කිරීම හා නීති අංශය හා මූල්‍ය අංශය මගින් ලබා දුන් උපදෙස් මත තත්‍ය ගණනය කළ හෙයින් ඒ සඳහා ගතවූ කාලය මත අදාල පාරිතෝෂික ගණනය කිරීමට අධිභාරයක් ගෙවීමට සිදු වී තිබුණි. | නිවැරදිව ගණනය කිරීම් සිදුකර නොපමාව ගෙවීම් කිරීම නිලධාරීන්ගේ වගකීම විය යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභාව විසින් රු.1,200,000,000 ක මුදලක් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. | 2011.06.09 වන දින අධ්‍යක්ෂ ජනරාල් විසින් කෙටිකාලීන ආයෝජන සඳහා අනුමැතිය ඉල්ලා මුදල් අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකර ඇති බව. | ආයෝජනයන් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හා 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර | අදාල නිලධාරීන්ගේ වැටුපෙන් අඩුනොකර කොමිෂන් සභාවේ අරමුදලින් උපයන විට ගෙවීම් මත බදු වශයෙන් | උපයන විට බදු ගෙවීම අදාල නිලධාරීන්ගෙන් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත අනුව උපයන විට ගෙවීම් මත බදු අදාල නිලධාරීන්ගෙන් අඩුකර |

| | | | | |
|---|---|---|---|---|
| | චක්‍රලේඛය | රු.9,163,291 ක්සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | සිදුවේ. නමුත් මෙම නිලධාරීන්ගෙන් අඩුකරනු ලබන බදු කොමිෂන් සභාව විසින් නිලධාරීන්ට ප්‍රතිපූර්ණය කරයි. මෙසේ උපයන විට ගෙවීම් සේවකයන්ගෙන් අඩුකිරීම ප්‍රතිපූර්ණය කිරීමේ නීතිමය තත්ත්වය නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසන ලදී. එහිදී 2018 දෙසැම්බර් 26 දිනැති E/31/18/TRC දරන නීතිපති දෙපාර්තමේන්තුවේ පිළිතුර මගින් උපයන විට ගෙවීමේ බදු සේවකයන්ට නැවත ප්‍රතිපූර්ණය කිරීමේ නීතිමය බාධාවක් නොමැති බව දන්වන ලදී. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු අතර එම මුදල නැවත ප්‍රතිපූර්ණය සිදුකළ නොහැකිය. |
| (ඇ) | 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත | විදුලි සංදේශ බදු ඊළඟ මාසයේ 15 දිනට පෙර ගෙවිය යුතු වුවද 2020 අගෝස්තු 18 දින වන විටත් එක් ආයතනයකින් රු.6,358,657 ක් අය විය යුතුව පැවතුණි. | නොගෙවූ විදුලි සංදේශ බදු අයකර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත. | විදුලි සංදේශ බදු පනත අනුව විදුලි සංදේශ බදු අයකර ගත යුතුය. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | 9.14.2 වගන්තිය | බඳවා ගැනීමේ පරිපාටිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟතාවය ලබාගත යුතු වුවද එසේ ලබානොගෙන කොමිෂන් සභාව විසින් බඳවා ගැනීමේ පරිපාටිය | කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පටිපාටිය 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 9.3.1 වගන්තියට අනුව , කොමිෂන් සභා තීරණ අංක 2K14.206.07 | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන චක්‍රලේඛයේ 9.14.2 වගන්තිය ප්‍රකාර භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අනුමත කර තිබුණි. | අනුව 2014.05.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර තිබුණි. | |
| (ඉ) | 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1 ඡේදය | වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොගෙන කාර්ය මණ්ඩලය වෙත දිරි දීමනා, ප්‍රසාද දීමනා, ගෙවල් කුලී දීමනා හා භාවිතයට නොගත් නිවාඩු සඳහා දීමනා ලෙස රු.126,488,209 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතෙහි 22C(2) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ අනුමැතිය මත කාර්ය මණ්ඩලය දීමනා ගෙවා ඇති අතර කොමිෂන් සභාවට වැටුප් සහ දීමනා තීරණය කිරීමේ බලතල එම පනත මගින් පැවරී ඇත. නීතිපතිතුමාගේ E/164/07/TRC හා 2007 අගෝස්තු 15 සහ E/165/07/TRC හා 2007 සැප්තැම්බර් 24 දිනැති ලිපි මගින්ද තවදුරටත් ඒ පිළිබඳව එකඟතාවය පලකර ඇත. | අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව දීමනා සහ වැටුප් ගෙවීමේදී වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඊ) | 2007 ජුනි 01 දිනැති අංක එන්එස්සීසී/3/ඒබීසී/24 දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලිපිය | මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය සඳහා අනුමත මාසික ප්‍රවාහන දීමනාවක් වූ රු.2,000 ඉක්මවා රු.6,000 බැගින් ගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදී රු.8,196,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | 2010 මාර්තු මස 11 දින අංක 2KX.189.15(17) කොමිෂන් සභා තීරණය පරිදි මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රවාහන දීමනාව රු.6,000 ගෙවීම අනුමත කර තිබුණි. | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලිපිය අනුව අනුමත කරන ලද දීමනාව පමණක් ගෙවීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 37,883,540,711 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 45,706,552,824 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,823,012,113 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට බලපත්‍ර ගාස්තු ආදායම, විදුලි සංදේශ බදු ආදායම, විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු ආදායම (Levy on outgoing local access charges) රු. 11,261,338,834 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

2018 නොවැම්බර් 05 දින හා 2019 දෙසැම්බර් 01 දින සිදුකරන ලද සංශෝධනයන්ට අනුව විදුලි සංදේශ බදු සියයට 25 සිට සියයට 11.25 දක්වා අඩුවීම හේතුවෙන් විදුලි සංදේශ බදු ආදායම රු. 9,283,607,990 කින් අඩුවීම, 2019 ජූනි 11 සිට ක්‍රියාත්මක වන පරිදි පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු ඉවත්කරතිබීම හා ස්මාර්ට් ෆෝන් භාවිතය, ඕවර් ද ටොප් (Over the top) නොමිලේ භාවිතා කළ හැකි මොබයිල්ඇප්ලිකේෂන් භාවිතය ඉහල යාමද ආදායම අඩුවීමට බලපා තිබුණි.

කොමිෂන් සභාවේ මුළු වියදමින් පරිපාලන හා මෙහෙයුම් වියදම් සඳහා සියයට 89 ක් වැය කර තිබුණ අතර කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා සඳහා සියයට 55 ක් ඒ තුළ ඇතුළත් වී තිබුණි. එසේ වුවද ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වන විදුලි සංදේශ නියාමනය සඳහා මුළු වියදමෙන් සියයට 10 ක් පමණක් වැය කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් සමාගම විසින් කුලුන මෙතෙක් කොමිෂන් සභාවට භාරදී නොතිබුණද 2019 සැප්තැම්බර් 16 දින නෙළුම් කුලුන විවෘත කිරීමේ උත්සවය සඳහා රු.11,325,012 ක් දරා තිබුණි. | සටහන් කරගතිමි. | අනාර්ථික ගනුදෙනු සිදුකිරීම නොකළ යුතු අතර ව්‍යාපාරික කටයුතු තවදුරටත් පමා නොකර ආරම්භ කළ යුතුය. |
| (ආ) | 2019 සැප්තැම්බර් 16 වන දින පැවති කොළඹ නෙළුම් කුලුන විවෘත කිරීමේ උත්සවයේ කටයුතු, කළමනාකරණ කිරීම සඳහා හා ආහාරපාන සැපයීම සඳහා ගිවිසුම් | 2019 වර්ෂය සඳහා අයවැය සැලසුම් සැකසීමේදී අදාල අංශය වන විශේෂ ව්‍යාපෘති අංශය මගින් නෙළුම් කුළුණ විවෘත කිරීම පිළිබඳ නිසි තීරණයක් ගෙන ප්‍රතිපාදන වෙන්කර ගැනීමක් සිදුකර නොතිබුණි. එම නිසා | වර්ෂය තුළ සිදුකරනු ලබන සියළු කොන්ත්‍රාත් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නිසි පාලනයකින් එම කටයුතු කළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව |

| | | | |
|---|---|---|---|
| | ගතවීමකින් තොරව රු.7,072,472 ක් ගෙවා තිබූ අතර එම ප්‍රසම්පාදනයන් 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට හෝ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | 2019 ප්‍රසම්පාදන සැලැස්මට මෙම ප්‍රසම්පාදනය ඇතුළත් වී නොතිබුණ අතර වසර මැද සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මටද ඇතුළත් කිරීමට නොහැකි විය. | ගිවිසුම් මගින් කොන්ත්‍රාත් ප්‍රදානයන් සිදුකළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොකාවිල් මධ්‍යස්ථානයේ ජංගම මෙහෙයුම් ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් වහලය ජලනිවාරණය කිරීම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයට 2017 වර්ෂයේදී සෘජු කොන්ත්‍රාත්තුවක් පවරා තිබුණද තාප පරිවාරක වැඩ ඇස්තමේන්තු නොකිරීම නිසා ඉල්ලීම් කළ නඩත්තු කටයුතු සිදුකර නොතිබුණි. 2018 දී කොන්ත්‍රාත්කරුගේ සුදුසුකම් නිසි ඇගයීමකට ලක් නොකර නව කොන්ත්‍රාත්තුවක් රු.1,116,350 කට පෞද්ගලික ආයතනයක් වෙත 2019 ජූනි 19 දින පිරිනමා සමාලෝචිත වර්ෂයේදී වැඩ නිම කරවාගෙන තිබුණි. කොමිෂන් සභාව ප්‍රසම්පාදන කාලසටහනට අනුව කටයුතු කර නොතිබීම නිසා මෙම කාර්යය සඳහා වසර 03 කට ආසන්න කාලයක් ගත කර තිබුණි. | ආයතනයේ එවකට කාර්මික නිලධාරියෙකු නොසිටි බැවින් ඉංජිනේරු කාර්ය පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයෙන් ඉංජිනේරු හා උපදේශක සේවය ලබාගන්නා ලදී. එම ආයතනයටද එම Heat insulation work යන කොටස ඇතුළත් කිරීමට අතපසු වී තිබුණි.<br>එසේම මෙම අඩුපාඩු ඉදිරි ප්‍රසම්පාදන කටයුතුවලදී නොවීමට සැලකිලිමත් වන බවද දන්වමි. | ප්‍රසම්පාදන කාලසටහනට අනුව කොන්ත්‍රාත් සිදුකිරීම කළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ලංසු ඇගයීම් කළ යුතුය. |
| (ආ) | කොමිෂන් සභාවේ නව ගොඩනැගිල්ල ඉදිකිරිම | | |
| | (i) 2016 අගෝස්තු 24 දිනැති අමප/16/1604/701/022 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කොමිෂන් සභාවේ දැනට පවතින “ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීමට” අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද අධ්‍යක්ෂ ජනරාල් විසින් | සටහන් කර ගතිමි. | වැරදි තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරීන් වගකිව යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොමිෂන් සභාවට ''නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම'' සඳහා රු. මිලියන 502 ක් වැය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවටත් හා උපදේශක ආයතන සමඟ සාකච්ඡා කර එය රු. මිලියන 344 දක්වා අඩුකර ගත් බවටත් දක්වමින් 2018 ජූලි 10 දින අවශ්‍ය කමිටු පත්කිරීම සඳහා ජනාධිපති ලේකම් වෙත දන්වා තිබුණි. | | |
| (ii) | එසේ වුවද රු.මිලියන 200 ක ඇස්තමේන්තුවක් සහිතව ''කොමිෂන් සභාවේ ප්‍රධාන ගොඩනැගිල්ලක දිගුවක්'' ලෙස නැවත කොන්ත්‍රාත්තුව වෙනස් කර අනුමැතියකින් තොරව ලංසු කැඳවා තිබූ අතර ඉහත පත්කරන ලද කමිටු මෙම කොන්ත්‍රාත්තුව සඳහාද කටයුතු කර තිබුණි. තවද නිසි සැලසුමකින් කටයුතු නොකිරීම නිසා අතිරේක වැය වෙනුවෙන් රු. මිලියන 33 ක් ඇස්තමේන්තු කර තිබුණි. | තාක්ෂණික අංග එකතු කිරීම, නව වැසිකිලි පද්ධතියක් හඳුන්වා දීම, ගොඩනැගිලි ඉදිරියට Canopy හඳුන්වා දීම තුලින් ගොඩනැගිල්ලේ භාවිතය ඉහල නැංවීමට අපේක්ෂා කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව අනුමැතිය ලබාගත යුතු අතර නිසි සැලැස්මකට අනුව කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමට ආයතනය කටයුතු කළ යුතුය. |
| (iii) | කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට නියමිත 2020 පෙබරවාරි 14 දින වන විට නිමකර නොතිබුණි අතර දින 10 කින් කාලය දීර්ඝ කිරීමට උපදේශක ආයතනය නිර්දේශ කර තිබුණද ඒ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | එකඟ වේ. | කාලය දීර්ඝ කිරීමක් සඳහා අනුමැතිය ලබාදී නොමැති බැවින් උපදේශකගේ නිර්දේශයන් ලබාගෙන ප්‍රමාද ගාස්තු අයකළ යුතුය. |
| (ඇ) | නෙළුම් කුලුන ව්‍යාපෘතිය<br>--------------------------<br>2010 ඔක්තෝබර් 29 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නෙළුම් කුලුන ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2012 ජනවාරි 03 දින විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව චීන සමාගම් 02 ක් සමඟ කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණි. කොන්ත්‍රාත් වටිනාකම ඇ.ඩො. 104,300,000 ක් වූ අතර 2012 නොවැම්බර් 12 සිට 2015 මැයි | | |

| | | |
|---|---|---|
| 12 දක්වා දින 912 කින් මෙම කොන්ත්‍රාත්තුව නිම කළ යුතුව පැවතුණද 2017 ඔක්තෝබර් 31 දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා කොමිෂන් සභාව අනුමත කර තිබුණි.මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා අරමුදල් සපයා ගැනීමට 2012 සැප්තැම්බර් 17 දින ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සාභාව, EXIM බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹ තිබුණි. එම ණය ගිවිසුමට අනුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 85 ක් එනම් ඇ.ඩො. මිලියන 88.655 ලබා දීමට එකඟ වී තිබුණ අතර 2016 අගෝස්තු 18 දින වන විට ණය මුදල ලබාගෙන අවසන් කළ යුතු විය. | | |
| (i) 2011 දෙසැම්බර් 14 දිනැති අංක/අමප/11/2262/501/026/ටී බීආර් දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නෙළුම් කුලුන ඉදිකරන ලද හෙක්ටයාර් 2.59 ක් වූ ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය විසින් කොමිෂන් සභාව වෙත පවරා දිය යුතුව තිබුණද එසේ පවරා දී නොතිබුණි. | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් සෘජුවම ඉඩම අත්පත් කරගැනීම පිණිස අමාත්‍යය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අදාළ ලිපි ලේඛන රේඛීය අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ. | අප්‍රමාදව ඉඩම පවරා ගැනීම සිදුකළ යුතුය. |
| (ii) ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව නියමිත පරිදි නිම නොකිරීම හේතුවෙන් ණය මුදලින් සියයට 76 ක් හෙවත් ඇ.ඩො. 67,259,758 ක් පමණක් ලබාදී තිබුණි. එසේ වුවද මුළු ණය මුදලම සඳහා රක්ෂණ ගාස්තු, එකඟතා ගාස්තු හා කළමනාකරණ ගාස්තු ගෙවියයුතු බැවින් ලබා නොගත් ණය මුදලට සමානුපාතිකව ගෙවා තිබුණු රක්ෂණ ගාස්තුව, එකඟතා ගාස්තු හා කළමනාකරණ ගාස්තු ප්‍රමාණය ඇ.ඩො. 2,911,633 ක් නිශ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි. | සටහන් කර ගතිමි. | ඉදිකිරීමේ ප්‍රමාදය නිසා ලබාගැනීමට නොහැකි වූ ණය මුදල සඳහා නිශ්කාර්යව ගෙවන ලද රක්ෂණ ගාස්තු, එකඟතා ගාස්තු, කළමනාකරණ ගාස්තු සඳහා අදාල පාර්ශවයන් වගකිව යුතුය. |
| (iii) මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ශක්‍යතා වාර්තාව අනුව 2015 වර්ෂයේ සිට ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් වාර්ෂිකව රු.මිලියන | වාණිජ ක්‍රියාකාරකම් ඇරඹීම රජයේ අයිතිය ඇති සමාගමක් මගින් සිදු කිරීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. | ආයතනයට වාණිජ ක්‍රියාකාරකම් ඇරඹීය නොහැකි බව හඳුනා |

| | | | |
|---|---|---|---|
| | 1,685 ක ආදායමක් ඉපයීමට සැලසුම් කළද ව්‍යාපෘති කටයුතු ප්‍රමාදවීම මත එම ආදායම අහිමි වී තිබුණි. | | නොගෙන කටයුතු කිරීම නිසා අහිමි වන ආදායම වලක්වා ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iv) | කොමිෂන් සභා පනත අනුව සමාගමක් පිහිටුවීමට බලතල නොමැති නමුත් 2010 ඔක්තෝබර් 29 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ අංක 5.4 viii මගින් කොමිෂන් සභාවේ හිමිකාරිත්වය යටතේ කළමනාකරණ උපදේශක සමාගමක් පිහිටු වීමට අනුමැතිය ලබාදී තිබුණි. එම නිසා නැවත 2019 සැප්තැම්බර් 11 දිනැති අංක අමප/19/2305/103/140 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් කොළඹ නෙළුම් කුලුනේ වාණිජකරණ කටයුතු කළමනාකරණය කිරීම පිණිස රාජ්‍ය සමාගමක් ස්ථාපනය කිරීමට භාණ්ඩාගාරයට බලය පවරා තිබුණද එම කටයුතු විගණිත දිනවන විටත් සිදු කර නොතිබුණි. | වාණිජ ක්‍රියාකාරකම් ඇරඹීම රජයේ අයිතිය ඇති සමාගමක් මගින් සිදු කිරීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. | වාණිජ ක්‍රියාකාරකම් ඇරඹීම සඳහා අප්‍රමාදව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (v) | ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 වගන්තිය ප්‍රකාර දිනක ප්‍රමාද දඩ මුදල ගිවිසුම් මුදලින් සියයට 0.05 ක් සහ උපරිමය ගිවිසුම් මුදලින් සියයට 10 ක් විය. ඒ අනුව කොන්ත්‍රාත්කරුගෙන් අය කිරීමට නියමිත ප්‍රමාද දඩ මුදල වූ ඇ.ඩො. 10,430,000 ක් කොමිෂන් සභාව විසින් කොන්ත්‍රාත්කරු වෙතට ගෙවිය යුතුව තිබූ මුදලින් ගෙවීම් අත්හිටුවා තිබුණද ඒ සඳහා ව්‍යාපෘති උපදේශකගේ නිර්දේශයන් ලබාදී නොතිබුණි. | ක්‍රොන්ත්‍රාත් ගිවිසුම අනුව ප්‍රමාද දඩ මුදල වන ඇ.ඩො.10,430,000 ක්‍රොන්ත්‍රාත්කරුගෙන් අයකරන ලදි. | කොන්ත්‍රාත්කරුගෙන් අයකර අත්හිටුවා ගන්නා ලද ප්‍රමාද ගාස්තු සඳහා උපදේශක නිර්දේශය ලබාගත යුතුය. |
| (vi) | නෙළුම් කුලුන ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වැඩ නිමකර | කොන්ත්‍රාත් ගිවිසුම අනුව ප්‍රමාද දඩ මුදල වන | කොන්ත්‍රාත්තුව නිමකර භාරනොදීම |

| | | | |
|---|---|---|---|
| | 2017 ඔක්තෝබර් 31 දින භාරදිය යුතුව තිබුණද මෙතෙක් භාරදී නොතිබුණි. ඒ අනුව 2020 අගෝස්තු 31 දින වන විට ප්‍රමාද වූ කාලය දින 1035 ක් වුවද කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ප්‍රමාද ගාස්තු අය කිරීම දින 200 කට පමණක් සීමා වී තිබුණි. | ඇ.ඩො.10,430,000 ක්‍රොන්ත්‍රාත්කරුගෙන් අයකරන ලදී. | නිසා රජයට සිදුවන ආදායම අහිමි වීම සඳහා සහ අමතර උපදේශක ගාස්තු ඇතුළු අනිකුත් වියදම් සඳහා කොන්ත්‍රාත්කරු ඇතුළු අදාල පාර්ශවයන් වගකිව යුතුය. |
| (vii) | ව්‍යාපෘතියේ ආදායමෙන් ණය වාරික ගෙවීමට සැලසුම් කර තිබුණද ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින වනවිට ණය වාරික හා පොලී වශයෙන් ඇ.ඩො. 39,335,307 ක් කොමිෂන් සභාව ගෙවා තිබුණි. මෙසේ ණය හා වාරික ගෙවීමට සිදුවීම හේතුවෙන් 2016 වර්ෂයට සාපේක්ෂව ඒකාබද්ධ අරමුදලට කරන ලද ප්‍රේෂණ 2017, 2018 හා 2019 වර්ෂවලදී රු. මිලියන 30,400 ක් අඩු වී තිබුණි. | සටහන් කර ගතිමි. | කොන්ත්‍රාත්තුව නිමකර භාරනොදීම නිසා රජයට සිදුවන ආදායම අහිමි වීම සඳහා සහ අමතර උපදේශක ගාස්තු ඇතුළු අනිකුත් වියදම් සඳහා කොන්ත්‍රාත්කරු ඇතුළු අදාල පාර්ශවයන් වගකිව යුතුය. |
| (viii) | නෙළුම් කුලුන ඉදිකිරීම සඳහා ණය මුදලක් ලබාගැනීම හේතුවෙන් එකඟතා ගාස්තු, කළමනාකරණ ගාස්තු, රක්ෂණ ගාස්තු හා 2019 දෙසැම්බර් 31 දිනට පොලී ලෙස එකතුව ඇ.ඩො. 23,775,376 ක මුදලක් අතිරේකව දැරීමට කොමිෂන් සභාවට සිදුවී තිබුණි. | එකඟ වේ. | රජයට උපරිම වාසි ලැබෙන පරිදි ණය මුදල් ලබාගැනීමේදී අතිරේකව දැරීමට සිදුවන වැය දැරීම් අවම කර ගැනීමට කටයුතු කිරීම වගකිව යුතු නිලධාරීන්ගේ වගකීම විය යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය, සේවක සංඛ්‍යාව හා බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කර නොතිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසානයට මුළු පුරප්පාඩු සංඛ්‍යාව 66 ක් විය. | 2019 සැප්තැම්බර් 31 දිනට ප්‍රගතිය 40% ක් පමණ වුයෙන් තවදුරටත් මෙම ආයතනය තුළින්ම අදාල කාර්යයන් සාර්ථකව අවසන් කළ නොහැකි බැවින් උපදේශන ආයතනයක් මඟින් ඉටුකර ගැනීමට කටයුතු කරන ලදී. | අත්‍යාවශ්‍ය බඳවා ගැනීම් සිදුකිරීම, ආයතනික ව්‍යුහය හා බඳවා ගැනීමේ රීති බාණ්ඩයෙහි සිදුකළ යුතු වෙනස්කම් කඩිනමින් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ සහකාර ගණකාධිකාරී තනතුර සඳහා 2015 වර්ෂයේදී බඳවාගෙන තිබුණු නිලධාරීන් දෙදෙනෙකුට අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී වැටුප්, නිවාස කුලී දීමනා, දිරි දීමනා සහ ප්‍රවාහන දීමනා ලෙස රු.1,939,975 ක් ගෙවා තිබුණි. | මෙම අනුමත සෙසු තනතුරු 02 නැවත ඉහත අංක 01 යටතේ සංශෝධනය කිරීමට හෝ අනුමත කිරීමට කටයුතු කරනු ඇත. | සහකාර ගණකාධිකාරී තනතුරු දෙක සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතු බව |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් 42 ක් සම්පූර්ණයෙන් නිම කර නොතිබුණ අතර ප්‍රගතිය සියයට 10 සිට සියයට 80 දක්වා විය. | කාර්යයන් 42 ක් සම්පූර්ණයෙන් නිම නොකිරීමට හා එහි ප්‍රගතිය සියයට 10 සිට සියයට 80 දක්වා වීමට නොවැලැක්විය හැකි කරුණු සහ සාධක බලපාන ලදී. මෙම පසුබිම හැකිතාක් අවම කරගෙන කටයුතු කිරීමට ප්‍රගති සමාලෝචනයේදී අවශ්‍ය අවධානය යොමු කිරීමට ඉදිරියේදී කටයුතු සම්පාදනය කරමි. | සැලසුමට අනුව සැලසුම් කළ කාර්යයන් නිමකිරීම කළ යුතුය. |
| (ආ) | නියාමන වියදම් සඳහා අයවැය ප්‍රතිපාදන රු.678,550,000 ක් සලසා තිබුණද සත්‍ය වියදම රු.78,881,625 ක් පමණක් විය. ජාතික උපකරණ හඳුනාගැනීමේ ලේඛනය ක්‍රියාවට නැංවීම (Implementation of National Equipment Identification Registry – NEIR) වෙනුවෙන් රු. මිලියන 600 ක් වෙන්කර තිබුණද ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කර තිබීම හේතුවෙන් ආයතනය පිහිටුවීමේ අරමුණ වන විදුලි සංදේශ නියාමනය කිරිමේ කටයුතු මතභේදාත්මක විය. | මෙම කාර්යය ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කිරීම දෙවන කාර්තුවේදී ප්‍රගති සමාලෝචනයේදී කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණයක් මත සිදු කර ඇත. | සැලසුම් කරන ලද නියාමන වියදම් දැරීම් මගින් කොමිෂන් සභාවේ අරමුණු ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 වර්ෂයේදී සිදුකිරීමට සැලසුම් කළ සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 25 ක ප්‍රතිපාදන වෙන්කළ විදුලි සංදේශ පර්යන්ත උපකරණ පරීක්ෂා කිරීම සඳහා හොඳින් සන්නද්ධ විද්‍යාගාරයක් පිහිටුවීම මුදල් ප්‍රවාහ දුෂ්කරතා හේතුවෙන් | මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන අවස්ථාවේදී ජංගම වත්කම් ප්‍රමාණවත් නොවන බව වාර්තා කිරීම හේතුව නිසා මෙම කාර්යය අපේක්ෂිත පරිදි සිදු කිරීමට නොහැකි විය. එමෙන්ම රට තුල උද්ගත වූ තත්ත්වය මත රජය විසින් මුදල් | සැලසුම්කළ කාර්යයන් නිමකිරීම සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේදීද ඉටුකර නොතිබුණි. | අමාත්‍යාංශය හරහා නිකුත් කල චක්‍රලේඛනයන් ක්‍රියාත්මක කිරීමට සිදුවීමත් ඒ සඳහා බලපෑමක් කරන ලදී. | |
| (ඇ) | 2016 වර්ෂය තුළදී සිදුකළ යුතුව තිබූ වර්ණාවලි කළමනාකරණ අංශය ස්වයංක්‍රීය කිරීමේ පද්ධතිය (ADMS) ස්ථාපිත කිරීම සඳහා 2018 හා 2019 වර්ෂවලදීද සැලසුම් කර තිබුණද එය සිදු නොකර කල්දමා තිබුණි. | 2016 වර්ෂය තුලදී සිදුකළ යුතුව තිබූ වර්ණාවලි කළමනාකරණ අංශය ස්වයංක්‍රීය කිරීමේ පද්ධතිය (ASMS) ස්ථාපිත කිරීමට අදාළව 2019 වර්ෂය තුළදී කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීමට අමතරව අවසාන ව්‍යාපෘති සැකැස්ම සකස්කිරීම හා අදාල නිලධාරීන් තෝරාගැනීමට අපේක්ෂිත කරුණු අවසන් කිරීම සිදුකර ඇත. | වර්ණාවලී කළමනාකරණ අංශය ස්වයංක්‍රිය කිරීමේ පද්ධතිය නොපමාව ස්ථාපිත කිරීම කළ යුතුය. |

**4.2** **තිරසර සංවර්ධන අරමුණු**

----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණුපාදක කර ගනිමින් විදුලි සංදේශ තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධනය සඳහා 2030 වන විට සෑම ග්‍රාමීය ප්‍රදේශයක් තුළම විදුලි සංදේශ කටයුතු ආවරණය කිරීමේ ඉලක්කය කරා ලඟා වීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංඩිස්ථාන ආවරණය කිරීමේ ප්‍රමාණයන් හඳුනාගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවීය. | තිරසර සංවර්ධන අරමුණු පාදක කරගනමින් විදුලි සංදේශ තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධනය සඳහා සෙසු දිස්ත්‍රික්කද ආවරණය කරමින් 2030 වනවිට සෑම ග්‍රාමීය ප්‍රදේශයක් තුළම විදුලි සංදශ කටයුතු ආවරණය කිරීමට බලාපොරොත්තු වේ. | 2030 වනවිට සෑම ග්‍රාමීය ප්‍රදේශයක් තුළම විදුලි සංදේශ කටයුතු ආවරණය කිරීමේ ඉලක්ක කරා ලඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය සඳහා සංඩිස්ථාන ආවරණය කිරීමේ ප්‍රමාණයන් හඳුනාගැනීම කළ යුතුය. |